*සැ. යු.-* 2023.12.22 දින පළ වූ අංක 2364 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,365 - 2023 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2023.12.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 3782 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 3800 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජනවාරි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3779 - B 82527 — 5,403 (2023/12)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාව

## 2023 වර්ෂයේ ඉඳුරාම බඳවා ගැනීමට නිලධාරි/ නිලධාරිනි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරීන්/නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

   අ. විධායක අංශය (නිත්‍ය)
   ආ. සාගරික ඉංජිනේරු අංශය
   ඇ. සැපයුම් අංශය
   ඈ. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය
   ඉ. වෛද්‍ය අංශය (පරිපාලන නිලධාරි සෞඛ්‍යය)
   ඊ. දන්ත වෛද්‍ය අංශය
   උ. තොරතුරු තාක්ෂණ අංශය
   ඌ. විධායක අංශය (ස්වේච්ඡා)
   එ. කෘෂි නිලධාරි (ස්වේච්ඡා)
   ඒ. ඉංග්‍රීසි භාෂා උපදේශක නිලධාරි (ස්වේච්ඡා)
   ඔ. ගිණුම් කළමනාකරණ නිලධාරි (ස්වේච්ඡා)

3. මූලික අධ්‍යාපන සුදුසුකම්;

   අ. අ.පො.ස (සා/ පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයයන්වලට සම්මාන (C) සාමාර්ථයන් සමග ගණිතය විෂය ඇතුලත් ව විෂයයන් 06ක් සමත් ව තිබීම;

   *හෝ*

   ආ. අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථයක් සමග ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුලත් ව විෂයයන් 06ක් සමත් වී තිබීම හා ඉංග්‍රීසි විෂය සම්බන්ධව ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

4. උසස් අධ්‍යාපනය සහ වෘත්තීය සුදුසුකම්;

   **අ. විධායක අංශය (නිත්‍ය නාවික හමුදාව)**

   | | | |
   |---|---|---|
   | නිලය | - | උප ලුතිනන් (පිරිමි අපේක්ෂකයින් පමණි) |
   | අධ්‍යාපන සුදුසුකම් | - | ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යා අංශයෙන් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
   | වයස | - | අවුරුදු 30ට අඩු විය යුතුය. |

   **ආ. ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

   | | | |
   |---|---|---|
   | නිලය | - | ලුතිනන් |
   | අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස (උ. පෙළ) ගණිත අංශයෙන් අවමය සම්මාන දෙකක් සහිතව විෂයයන් තුනක් සමත් ව තිබීම සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත දේශීය හෝ විදේශීය පිළිගත් සාගරික/ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී විෂයයන් සම්බන්ධයෙන් වසර හතරක උපාධියක් හදාරා තිබීම. |
   | වයස | - | අවුරුදු 32ට අඩු විය යුතුය. |

ඇ. **සැපයුම් අංශය (නිත්‍ය නාවික හමුදාව)**

නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, තක්සේරු විෂයයන් සඳහා විශේෂ උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතුය.

ඇ. **දන්ත වෛද්‍ය (නිත්‍ය නාවික හමුදාව)**

( 1 ) දන්ත වෛද්‍ය ශිෂ්‍ය

(අ) මධ්‍ය නිලධාරි - (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - දන්ත වෛද්‍ය පීඨයේ පළමු, දෙවන, තුන්වන හා සිව්වන වර්ශාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ පළමුවන දන්ත ශල්‍ය වෛද්‍ය (BDS) විභාගය සමත්ව තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාවේ තෙවන වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම.

වයස - අවුරුදු 28ට අඩු විය යුතුය.

(ආ) වැඩ බලන උප ලුතිනන් - (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - දන්ත වෛද්‍ය පීඨයේ පස්වන හා හයවන වර්ශාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ දෙවන දන්ත ශල්‍ය වෛද්‍ය (BDS ) විභාගය සමත්ව තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාවේ සිව්වන වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම.

වයස - අවුරුදු 30ට අඩුවිය යුතුය.

(ඇ) උප ලුතිනන් - (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - දන්ත වෛද්‍ය පීඨයේ හත්වන හා අටවන වර්ශාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ අවසාන දන්ත ශල්‍ය වෛද්‍ය ( BDS) විභාගය පළමු කොටස සමත්ව තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාවේ අවසන් වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම.

වයස - අවුරුදු 32 ට අඩු විය යුතුය.

(2) **දන්ත වෛද්‍ය නිලධාරි (නිත්‍ය නාවික හමුදාව)**

(අ) **වෛද්‍ය ලුතිනන් (දන්ත)**

අධ්‍යාපන සුදුසුකම් - දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය (BDS) හෝ ඊට සමාන සුදුසුකමක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම.

වයස - අවුරුදු 35ට අඩු විය යුතුය.

ඉ. **විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

(1) උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් විදුලි/ විද්‍යුත්/ විදුලි සංදේශන/ යාන්ත්‍ර ඉලෙක්ට්‍රෝනික විද්‍යාව සම්බන්ධයෙන් වසර හතරකට වැඩි උපාධියක් හදාරා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතුය.

(2) ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් විදුලි/ විද්‍යුත්/ විදුලි සංදේශන/ යාන්ත්‍ර ඉලෙක්ට්‍රෝනික විද්‍යාව සම්බන්ධයෙන් වසර හතරකට වැඩි උපාධියක් ලබා තිබීම සමග ECSL ලියාපදිංචිය.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඊ **වෛද්‍ය නිලධාරි අංශය - පරිපාලන නිලධාරි සෞඛ්‍යය (නිත්‍ය නාවික හමුදාව)**

(1) වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෙද හෝ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

(2) උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෙද හෝ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ රෝහල් හෝ වෛද්‍ය ක්ෂේත්‍රයේ අවම වසරක් හෝ ඊට වැඩි සේවා පළපුරුද්දක් තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

උ. **තොරතුරු තාක්ෂණ නිලධාරි(නිත්‍ය නාවික හමුදාව)**

(1) වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - අන්තර් ජාතිකව පිළිගත් Red hat සුදුසුකම් ලාභියෙකු, Sun Solaris සහතිකපත් ලාභියෙකු හෝ සහතිකපත් ලාභී Ethical Hacker වරයෙකු විය යුතුය.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

(2) උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් තොරතුරු තාක්ෂණය හෝ පරිඝණක විද්‍යාව පිළිබඳ අවුරුදු 03ක විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.
තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවම මාස 12ක පළපුරුද්දක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඌ. **විධායක අංශය (ස්වේච්ඡා නාවික හමුදාව)**

නිලය - වැ/බ උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතුය.

එ. **කෘෂි නිලධාරි (ස්වේච්ඡා)**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිනන් (පිරිමි අපේක්ෂකයන් පමණි) |
| අධ්‍යාපන සුදුසුකම් | - | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිවිද්‍යාව සම්බන්ධව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.<br>අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතුය. |

ඒ. **ඉංග්‍රීසි භාෂා උපදේශක නිලධාරි (ස්වේච්ඡා)**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිනන්(පිරිමි/ කාන්තා) |
| අධ්‍යාපන සුදුසුකම් | - | පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 03ක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උපාධියක් සමග රජයේ හෝ පිළිගත් ආයතනයක වසර 03ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම<br>හෝ<br>ගුරු පුහුණු විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම සමග රජයේ හෝ පිළිගත් ආයතනයක වසර 03ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතුය. |

ඔ. **ගිණුම් කළමනාකරණ නිලධාරි (ස්වේච්ඡා)**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිනන් (පිරිමි/ කාන්තා) |
| අධ්‍යාපන සුදුසුකම් | - | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණ හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතුය. |

5. **අනෙකුත් සුදුසුකම් :**

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා නිත්‍ය හා ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය;

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | වයස | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතුය. |
| ඇ. | උස | - | පිරිමි - අඟල් 66ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - අඟල් 63ට නොඅඩු විය යුතුය. |
| ඈ. | බර | - | පිරිමි - කි.ග්‍රෑ. 52ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - කි.ග්‍රෑ. 41ට නොඅඩු විය යුතුය. |
| ඉ. | පපුව | - | පිරිමි අඟල් 32ට නොඅඩු විය යුතුය. |
| ඊ. | වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II (නිසි පෙනුම). |

| | | | |
|---|---|---|---|
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) [වෛද්‍ය අංශය-පරිපාලන නිලධාරි සෞඛ්‍යය,දන්ත වෛද්‍ය සහ සැපයුම් අංශයන් සඳහා පමණක් 6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති පුද්ගලයන් සලකා බැලිය හැක.] |
| ඌ. | සිවිල් තත්වය | - | විවාහක/අවිවාහක. |

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ. තවද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ.

7. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස,වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/ අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත ශ්‍රී ලංකා නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ ඇය ගැන සලකා බලනු ලැබේ.

8. සේවා කොන්දේසි;

අ. අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් නිත්‍ය හා ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරී/නිලධාරිනී තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. පාඨමාලාවේ කාලය බඳවාගනු ලබන ඒ ඒ අංශය අනුව වෙනස් වේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරීන්/නිලධාරිනියන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. සියලුම නිලධාරීන්/නිලධාරිනියන් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළදී හා ඉන්පසුව නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඉ. අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම් නිලධාරියෙකු/නිලධාරිනියක හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ නිලධාරියා/නිලධාරිනිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරීන්/නිලධාරිනියන් හට නිලධාරී නිවාස තුළින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

ඌ. විවාහක නිලධාරීන්/නිලධාරිනියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

9. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා;

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

10. වැටුප් හා දීමනා;

2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| විස්තරය | මධ්‍ය නිලධාරි (රු.) | වැඩබලන උපලුතිනන් (රු.) | උප ලුතිනන් (රු.) | ලුතිනන් (රු.) | ලුතිනන් කොමාණ්ඩර් (රු.) |
|---|---|---|---|---|---|
| මූලික වැටුප | 32,750.00 | 41,905.00 | 47,615.00 | 55,625.00 | 60,965.00 |
| ජීවන වියදම් දීමනාව | 7,800.00 | 7,800.00 | 7,800.00 | 7,800.00 | 7,800.00 |
| නිල ඇඳුම් දීමනාව | 525.00 | 525.00 | 525.00 | 525.00 | 525.00 |
| දුෂ්කර ලැගුම් දීමනාව | - | 600.00 | 600.00 | 600.00 | 600.00 |
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අතුරු දීමනාව -2022 | 5000.00 | 5000.00 | 5000.00 | 5000.00 | 5000.00 |
| ආහාර දීමනාව | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| එකතුව | 84,921.80 | 94,676.80 | 100,386.80 | 108,396.80 | 113,736.80 |

අ. ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරීන්/ නිලධාරිනියන් සඳහා පමණක් හිමිවේ.

ආ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු.637.50 ක් ගෙවනු ලැබේ.

ඇ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට, කාලත්‍රයාට,දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඈ. කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට/නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරී නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඉ. නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

ඊ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට).

උ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට/නිලධාරිනියන්ට රු.3,200.00 සිට රු.7,700.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

11. අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස්;

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. **ඉල්ලුම්පත් 2024 පෙබරවාරි මස 05 වන දින දහවල් 12.00ට** ප්‍රථම ලැබෙන සේ 'ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවාගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ 01' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'ඉඳුරාම බඳවා ගැනීම 2023/02 - නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරීන්/නිලධාරිනියන්' යනුවෙන් සටහන් කළ යුතුයි. තවද, ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් මාර්ගගත ක්‍රමයටද අයදුම් කළයුතු අතර මෙම දෙයාකාරයෙන් ම ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකි අතර, වැඩි විස්තර දුරකතන අංක 011-7195120/ 011-7195154 මගින් ලබාගත හැක.

ආ. රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි) නියුතු අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම්කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇතිබව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/උපාධි සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(6) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතුය);
(7) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඈ. නියමකරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

12. ඉල්ලුම්පතෙ හි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/ අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිත ව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

13. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ;

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා;

| ස්ත්‍රී/පුරුෂ භාවය | PUSH UPS (මිනිත්තු 1ක් තුළ) | CURL UPS (මිනිත්තු 1ක් තුළ) | මීටර 1600 දුර දිවීම (මිනිත්තු) |
|---|---|---|---|
| පුරුෂ | 12 | 12 | 09 |
| ස්ත්‍රී | 08 | 07 | 11 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් නාවික හමුදා රෝහල මගින් සිදුකරන සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණය සඳහා යොමු කරන අතර, වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබයි. එම පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවාගනු ලැබේ.

ඈ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඉ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය Whatsapp පණිවිඩයක් මඟින් පමණක් දැනුම් දෙන අතර කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මඟින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඊ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

උ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත, ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඌ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද, එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේ ය.

එ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

ඒ. සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

***සටහන*** - මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

යූවීඑම්පී පෙරේරා, ආර්එස්පී**, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවට ඉඳුරාම බඳවා ගන්නා නිලධාරීන්/නිලධාරිනියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන තනතුර :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. විද්‍යුත් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————. (2024...... මස ..... වැනි දිනට )

10. උස :————. (අඟල්), පපුව :————. (අඟල්), පිරිමි පමණි. බර :————. (කි.ග්‍රෑ.)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිළධාරී කොට්ඨාසය :————.

15. දූරකතන (Whatsapp) අංකයඃ :————.

16. විවාහක/ අවිවාහක බව :————.

17. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් :————.

19. පාසල සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ඃ

| *පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |
| | | | |

21. දෙමව්පියන් පිළිබඳ විස්තර ඃ

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් ඃ..................................................................
..........................................................................................................................

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) ඃ ..........................................................................................................................
..........................................................................................................................

24. පාසලේ/ විශ්වවිද්‍යාලයේ/ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) ඃ .........
..........................................................................................................................
..........................................................................................................................

25. සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බළ සේනාවේ/ ශිෂ්‍යභට බළකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය ඃ ..................
..........................................................................................................................

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :....................
..........................................................................................................................................
..........................................................................................................................................

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න : ..........................................................................................................................
..........................................................................................................................................

28. රාජ්‍ය අංශයෙහි දෙපාර්තමේන්තුවක/ මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර/ සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :

..........................................................................................................................................
..........................................................................................................................................

29. *චරිත සහතික පිළිබඳ විස්තර*

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

30. ***අයදුම්කරු/ අයදුම්කාරිනිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය***

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාපිළිවෙල හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරිනියගේ අත්සන.

දිනය :————.

12-738

---

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

සමාජ සේවා දෙපාර්තමේන්තුව

**සංඥා භාෂා පරිවර්තක (III ශ්‍රේණිය)**

**වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)**

**නිවාස පාලක (III ශ්‍රේණිය)**

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සංඥා භාෂා පරිවර්තක තනතුරු 10ක්, වෘත්තීය උපදේශක තනතුරු 10ක් හා නිවාස පාලක තනතුරු 05ක් සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට 2024.01.25 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''සංඥා සභා පරිවර්තක (III ශ්‍රේණිය)/ වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)/ නිවාස පාලක (III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.scocilsrvice.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබාගත හැකිය.

*මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් :-*

1. *සංඥා භාෂා පරිවර්තක :*

1.1 *විවෘත බඳවා ගැනීම*

1.1.1 *වයස් සීමාව :* අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

1.1.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් වී තිබීම.

සහ

(*ආ*) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් ව තිබීම ප්‍රමාණවත් වේ.)

1.1.3. *වෘත්තීය සුදුසුකම් :*

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය.

1.1.4 *පළපුරුද්ද :* අදාළ නොවේ.

1.1.5 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.1.6. වෙනත් :

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම,

iii. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.1.7 *බඳවාගැනීමේ ක්‍රමය :*

ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

1.1.7.1 *ලිඛිත පරීක්ෂණය :*

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව | පැය 01 | 100 | 40 |

1.1.7.2 වෘත්තීය පරීක්ෂණය : සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම | පැය 01 | 100 | 40 |

1.1.8 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :* තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබාදෙනු නොලැබේ.)

1.1.9 *වැටුප් පරිමාණය :*

රා. ප. ච. 03/2016 අනුව MN 02-2016 වැටුප් පරිමාණය රු. 28,940-10x300-11x350-10x560-10x660-රු. 47,990/- වේ.

1.1.10 ***සටහන :***

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේ දී ම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්

සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුළු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

1.1.11. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා. ප. ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

1.2 සීමිත බඳවා ගැනීම :

1.2.1 අධ්‍යාපන සුදුසුකම් - සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම.

1.2.2 *වෘත්තීය සුදුසුකම්* :

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය.

1.2.3 *පළපුරුද්ද* : සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක හෝ නිවාස පාලක තනතුරක වසර 05කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1.2.4 *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.2.5 වෙනත් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර පහක (05) කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබීම.

1.2.6 *වයස* : අදාළ නොවේ.

1.2.7 *බඳවා ගැනීමේ ක්‍රමය* - ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

1.2.7.1 ලිඛිත විභාගය :

| විෂයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව | පැය 01 | 100 | 40 |

1.2.7.2 වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම | පැය 01 | 100 | 40 |

1.2.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

තනතුරට නියමිත සුදුසුකම් තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබා දෙනු නොලැබේ.)

1.2.9 **සටහන**

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේදී ම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙ හි මුලු ලකුණු එකතුවෙ හි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

1.2.10. සේවා කොන්දේසි :

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා. ප. ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

2. වෘත්තීය උපදේශක (ආහාර තාක්ෂණ, පරිගණක, හස්ත කර්මාන්ත, ජලනළ කාර්මික ශිල්පය, ජංගම දුරකථන අලුත්වැඩියාව, වෙළඳ සහායක, Graphic designing, සත්කාර සේවය)

2.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

2.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) වෘත්තීය උපදේශක (ආහාර තාක්ෂණය) තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා.පෙළ.) විභාගය සමත් ව තිබීම.

(ආ) වෘත්තීය උපදේශක (පරිගණක, හස්ත කර්මාන්ත, ජලනළ කාර්මික ශිල්පය, ජංගම දුරකථන අලුත්වැඩියාව, වෙළඳ සහායක, Graphic designing, සත්කාර සේවය) තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්

(i) සිංහල/දෙමළ/භාෂාව,ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා.පෙළ.) විභාගය සමත් ව තිබීම.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව, තෘතියික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

2.3. වෘත්තීය සුදුසුකම් :-

අදාළ වෘත්තීය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

*හෝ*

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය

*හෝ*

සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතන මගින් පවත්වනු ලබන දෑ අවුරුදු හෝ ඊට වැඩි පාඨමාලා සහතික පත්‍රය

*හෝ*

වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා ගැනීම;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

2.4. පළපුරුද්ද :-

අදාළ නොවේ.

2.5 කායික සුදුසුකම් :-
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

2.6 වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම;
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම;
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 1.1 සිට 1.6 දක්වා වන සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.7 බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් අතුරින් ඉහලම ලකුණු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් පමණක් වෘත්තීය පරීක්ෂණයට යොමු කරනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ද සමත්

වුවත් ඔවුන් ලිඛිත පරීක්ෂණයේදි ලබා ගත් ලකුණු වලත් වෘත්තීය පරීක්ෂණයේදි ලබා ගත් ලකුණු වලත් මුලු එකතුව අනුව කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. එම පිරිස මාස 03ක් ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර සහතිකයක් ලබා ගත යුතුය. එසේ සහතික ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තනතුරට බඳවා ගනු ලැබේ.

2.7.1. ලිඛිත පරීක්ෂණය :-

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| අවබෝධය | පැය 02 | 100 | 40% |

2.8. වැටුප් පරිමාණය :-
රා.ප.ච. 03/2016 අනුව MT-01-2016
වැටුප් පරිමාණය රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48890/= වේ.

2.9. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

2.10. **සටහන :**

- සමාජ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරණු ලබන ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.
- ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම් කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

3. **නිවාස පාලක**

3.1 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

3.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රිසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

3.3. වෘත්තීය සුදුසුකම් :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් ළමා සංවර්ධනය පිළිබඳ හෝ සමාජවැඩ පිළිබඳ හෝ නේවාසිකාගාර පාලනය පිළිබඳ මාස තුනකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

3.4. පළපුරුද්ද : අදාළ නොවේ.

3.5 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.6 වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 2.1 සිට 2.6 දක්වා වන සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3.7. බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකෙන් ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

3.7.1 ලිඛිත පරීක්ෂණය :-

| | | |
|---|---|---|
| I. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01, | මුළු ලකුණු 100, | සමත් ලකුණු 40% |
| II. භාෂා හැකියාව - කාලය පැය 01, | මුළු ලකුණු 100, | සමත් ලකුණු 40% |

3.8. වැටුප් පරිමාණය :-
රා.ප.ච. 03/2016 අනුව MN-01-2016
වැටුප් පරිමාණය රු. 27,140/- 10x300-11x350-10x495-10x660-රු. 45,540/- වේ.

3.9. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු

හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

3.10. **සටහන :**

- සමාජ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.
- ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

ඩබ්. ජී. ඩී. කරුණාරත්න,
සමාජ සේවා අධ්‍යක්ෂ (රා.ආ.)

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහළ,
II වන අදියර
සෙත්සිරිපාය
බත්තරමුල්ල.

.............................තනතුර සඳහා බඳවාගැනීමේ අයදුම්පත්‍රය

භාෂා මාධ්‍ය [ ]

01. මුලකුරු සමග නම :...............................................................................

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :...............................................................................
...............................................................................

03. ලිපිනය :...............................................................................

04. දුරකථන අංකය :...............................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය :...............................................................................

06. උපන් දිනය :...............................................................................

07. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :............ මාස :............ දින :............

08. විවාහක/අවිවාහක බව :...............................................................................

09. ස්ත්‍රී/පුරුෂ භාවය :...............................................................................

10. අධ්‍යාපන සුදුසුකම් :
I. අ. පො. ස. (සාමාන්‍ය පෙළ)
වර්ෂය :............ විභාග අංකය :............

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| ගණිතය | | | |
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි | | | |

II. අ. පො. ස. (උසස් පෙළ) ඃ

වර්ෂය ඃ විභාග අංකය ඃ

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් ඃ

| පාඨමාලාවේ නම | ආයතනය | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |
| | | |

12. පළපුරුද්ද ඃ

.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................

මෙම අයදුම්පතෙ හි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

....................................,
අයදුම්කරුගේ අත්සන.

12-650

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත වන අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 ජනවාරි** මස **29** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 දෙසැම්බර් මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | මිහින්තලේ | මාංකඩවල කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ නුවරගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය |
| අනුරාධපුරය | කැකිරාව | කලාගම් කෝරළේ දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කළාගම් පළාත කොට්ඨාසයේ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය |

12-733

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය.

නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඊ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධූරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 ජනවාරි** මස **30** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | තඹලගමුව | මොල්ලිපොතාන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

12-734

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිතියම් තාක්ෂණ නිලධාරි (පුහුණු කිරීමේ ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිතියම් තාක්ෂණ නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 39ක් සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 තනතුරු නාමය - සිතියම් තාක්ෂණ නිලධාරි (පුහුණු කිරීමේ ශ්‍රේණිය)

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය ඃ

තේමා සිතියම්, භූ ලක්ෂණාත්මක සිතියම් සහ අනෙකුත් සිතියම්වල දත්ත සැකසුම, දත්ත පද්ධතිවලට දත්ත ඇතුළත් කිරීම, දත්ත පද්ධති ඇසුරෙන් සිතියම් නිෂ්පාදනය, පුනරීක්ෂණය, තත්ත්ව පාලනය, අලෙවිය ඇතුළු සිතියම් නිෂ්පාදනයට අදාළ අනෙකුත් තාක්ෂණ කටයුතු, මැනුම් පිළිබඳ කාර්යාලයීය මූලික හා අවසන් කටයුතු, මහජනයාට පිඹුරු පිටපත් නිකුත් කිරීම, ඊට අදාළ ලේඛන පවත්වාගෙන යාම, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ මැනුම් දත්ත පද්ධතිවල කටයුතු

2.0 වැටුප ඃ

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* |
|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය | පළමු වසර දීමනාව මාසිකව රු. 27,140<br>දෙවන වසර දීමනාව මාසිකව රු. 27,440<br>(රා.ප.ච. 3/2016 හි උපලේඛන V විධිවිධාන අනුව) |
| III ශ්‍රේණිය | මාසිකව රු. 31,040-10x445-11x660 - 10x730-10x750 -රු. 57,550<br>(MN 3 -2016) |
| II ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10x445 - 11x 660 - 10x730 - 10x750 - රු. 57,550<br>(12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.)<br>(MN 3 - 2016) |
| I ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10x445 - 11x660-10x730 - 10x750 - රු. 57,550 (23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(MN 3-2016) |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු. 41,580 - 11x755 - 18 x 1,030-රු. 68,425<br>(MN 7 - 2016) |

3.0 *තනතුරෙහි සේවා කොන්දේසි* ඃ

3.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වනු ලබන දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් සහිත තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියේ සිතියම් තාක්‍ෂණ නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ.

3.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සිතියම් තාක්ෂණ නිලධාරි තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. තව ද, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

3.3 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සිතියම් තාක්ෂණ නිලධාරී තනතුරෙහි පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

3.4 සිතියම් තාක්ෂණ නිලධාරි තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

3.5 තෝරා ගනු ලබන්නන් මෙම ගැසට් නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළවන පොදු කොන්දේසිවලටද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලටද යටත් වේ.

3.6 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය.

3.7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු වේ.

3.8 III වන ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

3.9 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවට ද, දෙවසරක පුහුණුවෙන් පසු වසර 06ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, සර්වේයර් ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, නිලධාරියා/නිලධාරිනිය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් හෝ ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවන මුදල වන රු. 1,50,000 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ඇපකරුවන් දෙදෙනකුගේ සහතික වීම සහිතව බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතුය.

4.0 *සුදුසුකම් :-*

4.1 *අධ්‍යාපන සුදුසුකම් :*

සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන් දෙක (02) සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්වීම.

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

4.2 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3 *වෙනත් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

5.0 *වයස :*

5.1 අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

5.2 උපරිම සීමාව : අවුරුදු 30ට නොවැඩි

6.0 *පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය :*

සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනු පිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

6.1 ලිඛිත විභාගය :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| *විෂයයන්* | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% | පැය 02 |

6.1.1 විෂය නිර්දේශය :

I. *බුද්ධි පරීක්ෂණය.-*

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

II. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :*

ගණිතය :

- වීජ ගණිතය (අසමානතා, විචල්‍ය, ශ්‍රේණි, ලඝු ගණක)
- ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
- සංඛ්‍යානය (මධ්‍යන්‍යය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

භෞතික විද්‍යාව :

- ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය) දර්පන වක්‍ර පෘෂ්ඨය, ප්‍රිස්ම, කාච, ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂ්‍ය සහ දුරේක්ෂය)
- නිව්ටන් යාන්ත්‍රික විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

විවිධ මාතෘකා :

- භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
- ඝණ වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.

6.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ.

7.0 *පුහුණු කාලසීමාව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගැනීම :*

1. පුහුණු ශ්‍රේණිය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ආයතනය මගින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත්වන ආධුනිකයින්ගේ තනතුර අවසන් කරනු ලැබේ.

8.0 *අයදුම්පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම :*

8.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 4.3 දක්වා පළමු පිටුවෙහි ද, අංක 05 සිට 11.3 දක්වා දෙවන පිටුවෙහි ද, අංක 12 සිට 14 දක්වා ශීර්ෂ 03 පිටුවෙහි ද ඇතුළත් වන පරිදි ඉල්ලුම්පත්‍රය සැකසිය යුතුය.

8.2 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් වන අතර භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන බැවින් නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

8.3 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

8.4 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

*සැ. යු.* .- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9.0 *අයදුම්පත්‍ර භාර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම :*

9.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රුපියල් 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුල පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය -දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 *අයදුම්පත් යොමු කිරීම* :

11.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2024.01.29** වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
අංක 150,
නාරාහේන්පිට,
කොළඹ 05.

11.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වුවන් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඉන් පෙර ඉදිරිපත් කළයුතු වේ.

11.3 අයදුම්පත බහා එවන කවරයේ වම්පස කෙළවරේ ''සිතියම් තාක්ෂණ නිලධාරි තනතුරෙහි පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම - විවෘත පදනම'' යනුවෙන් අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

* *සැ.යු.*-**2024.01.29** දිනෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

12.0 *සාවද්‍ය තොරතුරු සැපයීම* :

මෙම විභාගය සඳහා ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත්කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන්කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 *විභාගයට පෙනී සිටීම* :

විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගත යුතුය. විභාග මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළයුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්ෂකයකු තමාට නියමකර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතුය.

14.0 *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩබ්ලිව්. සුදත් එල්. සී. පෙරේරා,
සර්වේයර් ජනරාල්,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව.

2023 දෙසැම්බර් මස 14 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

උපලේඛනය - 01

විභාගය පවත්වන මධ්‍යස්ථාන හා මධ්‍යස්ථාන අංක

| අනු. අංකය | මධ්‍යස්ථානය | මධ්‍යස්ථාන අංක |
|---|---|---|
| 01 | කොළඹ | 01 |
| 02 | දියතලාව | 02 |
| 03 | අනුරාධපුරය | 03 |

*ආදර්ශ අයදුම් පත්‍රය*

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

*ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිතියම් තාක්ෂණ නිලධාරි (පුහුණු කිරීමේ ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2023*

Open Competitive Examination for recruitment to the Post of Map Technological Officer (to the Training Grade) - 2023

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1.0 විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය :

2.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටුව තුළ අදාළ අක්ෂරය යොදන්න)

3.0 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A. B. C.

3.1 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.2 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

3.4 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.5 2024.01.22 වැනි දිනට වයස : අවු : මාස දින

3.6 ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M ස්ත්‍රී - F )

3.7 විවාහක/අවිවාහක බව : විවාහක අවිවාහක (අදාළ කොටුව තුළ " ✓" ලකුණ යොදන්න.)

4.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
4.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

4.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.3 දුරකථන අංකය (තිබේනම්) :————.

5.0 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
5.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
5.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

6.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

6.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.2 අ. පො. ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |

7.0 වෘත්තීය/තාක්ෂණික සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
7.1 හදාරා ඇති උපාධිය/පාඨමාලාව :————.
7.2 උපාධිය/පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම :————.
7.3 උපාධියේ/පාඨමාලාවේ කාලය :————.

8.0 වෙනත් සුදුසුකම් :————.

9.0 ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ''✓''ලකුණ යොදන්න.)

ඔව් ☐ නැත ☐

9.1 ''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න. :————.

10.0 ඔබ මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව :——
——.

11.0 විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ විස්තර ඃ

11.1 විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.

11.2 ලදුපත් අංකය හා දිනය :————.

11.3 ගෙවූ මුදල ඃ රු. ————.

| |
|---|
| *විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.*<br>*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)* |

12.0 *අයදුම්කරුගේ සහතිකය ඃ*

- මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත් ප්‍රකාශ කරමි.
- මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා එම තනතුරට පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.
- තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බවද ප්‍රකාශකර සිටිමි.
- මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................... මයා/මිය/මෙය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

————,

සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

14.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

*දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත්කර ඇති .............................. මයා/මිය/මෙය ..................... දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................ දින සිට ............... දින දක්වා ............... වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

12-661

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.